# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1530 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 |
| දිනය<br>திகதி<br>Date | 06/12/2023<br>පැය 0840 | | |

## මාධ්‍ය නිවේදනය

**රාජ්‍ය නොවන සංවිධානයක් මුවාවෙන් ව්‍යාජ ලෙස මුදල් එකතු කළ සැකකරුවෙකු සහ සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - ඇතිමලේ සහ සියඹලාණ්ඩුව පොලිස් වසම.**

2023.12.05 වන දින ඇතිමලේ පොලිස් වසමේ ගැමුණුපුර ප්‍රදේශයේදී රාජ්‍ය නොවන ආයතනයකින් පැමිණි බවට පවසමින් ප්‍රදේශවාසීන්ට ස්වයං රැකියා සඳහා මූල්‍ය ආධාර ලබා දෙන බවටත්, දූවා දරුවන්ට පොත් කට්ටල ලබා දෙන බවටත් පවසා මුදල් එකතු කරන බවට ඇතිමලේ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

එම විමර්ශන වලදී අනාවරණය වී ඇත්තේ එම සංවිධානය මඟින් ප්‍රදේශවාසීන්ට ස්වයං රැකියා සඳහා මූල්‍ය ආධාර ලබා දීම සහ පාසල් දරුවන් හට පොත් කට්ටලයක් ලබා දීමට කටයුතු කරන බවත් ඒ සඳහා එම සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට රුපියල් 600/- ක් ගෙවන ලෙසට පවසා මුදල් එකතු කර ඇති බවය. මෙලෙස එකතු කරන ලද මුදල් රුපියල් 26,000/- ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත. සැකකාරිය 2023.12.04 වන දින මෙලෙස මුදල් රුපියල් 136,000/- ක් එකතු කර ඇති බවත් එම මුදල් සමූපකාර බැංකුවක තැන්පත් කර ඇති බවටත් අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 28 ක් වන සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

2023.12.05 වන දින සියඹලාණ්ඩුව පොලිස් වසමේ මඩුගම ප්‍රදේශයේදී ඉහත ආකාරයටම මුදල් එකතු කරන බවට සියඹලාණ්ඩුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත පොලිස් නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර මෙලෙස මුදල් එකතු කරන ලද සැකකරුවෙකු සහ සැකකාරියක් එකතු කරන ලද මුදල් රුපියල් 70,300/- ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන මොණරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, සැකකාරිය වයස අවුරුදු 32 ක් වන සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අත්අඩංගුවට ගත් සැකකරු සහ සැකකාරියන් මෙවැනි ආකාරයට විවිධ ප්‍රදේශවල මෙවැනි වංචාවන් සිදුකර ඇත්ද යන්න සම්බන්ධව ඇතිමලේ සහ සියඹලාණ්ඩුව යන පොලිස් ස්ථාන වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මෙවැනි ආකාරයට ජනතාවට ත්‍යාග හෝ ණය මුදල් ලබා දෙන බවට පවසා විවිධ පුද්ගලයන් විසින් මුදල් එකතු කිරීමේ ජාවාරම්වල නිරතව සිටින අතර, මෙම පුද්ගලයන්ට හසු නොවන ලෙසටත් විමසිලිමත්ව කටයුතු කරන ලෙසත් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**